# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ

# අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතෙහි (සංශෝධිත පරිදි) විධිවිධාන යටතේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම සඳහා නිර්දේශ කිරීමට සලකා බැලීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් සුදුසු තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් අපරාධ නඩු කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් සහ මනා දැනුමක් සහිත නීතිඥවරයන් විය යුතුය :

**සෑම අයදුම්කරුවකුම :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
- ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය;
- අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු ලබන දිනය වන විට වයස අවුරුදු පනස් පහකට (55) වඩා නොවැඩි විය යුතු ය;
- දක්ෂ, ඉහළ අධ්‍යාත්මික තත්ත්වයක් ඇති කීර්තිමත් තැනැත්තකු විය යුතු ය;
- අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ධුරය භාර ගැනීමට පෙරාතුව පාරිශ්‍රමික ලබන වෙනත් සියලු ධුරවලින් ඉවත් විය යුතු ය.

  කෙසේ වුවද, යම් පාරිශ්‍රමිකයක් ලබන ධුරයක් දරන තැනැත්තකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ධුරය භාරගැනීමට පෙරාතුව පාරිශ්‍රමික ලබන සියලු ධුරවලින් ඉවත් වන්නේ නම්, එවැනි තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබීම සඳහා සලකා බලනු ලැබිය හැකිය;

  තවද, මෙම විධිවිධානය මගින් ද්විතියනය මත රාජ්‍ය සේවයේ නියුතු යම් රාජ්‍ය සේවකයකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබීම වළක්වනු නොලැබේ.
- අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ධුරය භාර ගැනීමට පෙරාතුව පවත්නා ලිඛිත නීතියට අනුව ස්වකීය වත්කම් හා බැරකම් ප්‍රකාශය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය; සහ
- අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස ධුරය භාරගැනීමට පෙරාතුව එකී පත්වීම් දිනය වන විට ස්වකීය සම්බන්ධතා පිළිබඳව පොදු හෙළිදරව් කිරීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

**තවද, එවැනි තැනැත්තකු :**

- දඩ මුදලකින් පමණක් දඬුවම් ලබන වරදකට හැර වෙනත් යම් අපරාධ වරදකට වරදකරු වී ඇත්නම්:
- නිසි අධිකරණ බලය සහිත අධිකරණයක් විසින් බුන්වත් තැනැත්තකු බවට  තීන්දු කර ඇත්නම්;
- මානසික වශයෙන් දුබල නම් හෝ එසේ මානසික වශයෙන් දුබල බවට පත් වේ නම් හෝ මේ පනත යටතේ වූ ස්වකීය කාර්ය ඉටු කිරීමට නොහැකිව සිටියි නම්;
- එම තැනැත්තාගේ කාර්ය සම්බන්ධයෙන් බරපතළ විෂමාචාරය සඳහා වරදකරුවකු වේ නම්;
- මේ පනතේ විධිවිධාන යටතේ වූ ස්වකීය බැඳීම් සමග අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරී නම්;
- යම් දේශපාලන ධුරයක් දරන නියෝජිතයකු හෝ ඒ සඳහා තෝරාගත් නියෝජිතයකු වේ නම්; හෝ
- ඒ සඳහා අදාළ වන්නා වූ නීතිවල විධිවිධාන යටතේ පවත්වනු ලබන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ මැතිවරණ, පාර්ලිමේන්තු මහමැතිවරණ, පළාත් සභා ඡන්ද විමසීම් හෝ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වල කාර්ය සඳහා පිළිගනු ලැබ ඇති යම් දේශපාලන පක්ෂයක යම් තනතුරක් හෝ සාමාජිකත්වයක් දරන හෝ දරනු ලැබ ඇත්නම්,

එවැනි තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කිරීම සඳහා හෝ එසේ අඛණ්ඩව ක්‍රියා කිරීම සඳහා නුසුදුසු විය යුතුය.

අයදුම්පත්‍ර, පාර්ලිමේන්තු වෙබ් අඩවියෙහි (www.parliament.lk) ක්ෂණික සබැඳි යටතේ **"අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම"** නමින් පළකර ඇති ආකෘතිය අනුව පිළියෙළ කළ යුතු අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2024 ඔක්තෝබර් මස 28 දින හෝ එදිනට පෙර,

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්,**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය.

**සටහන :** ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ/ විද්‍යුත් ලිපියෙහි විෂය වශයෙන් "**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත්කිරීම**" යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ මහ ලේකම්,**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය,**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**
**2024 ඔක්තෝබර් මස 13 දින.**